සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

අවසාන වාර පරීක්ෂණය - 2024 (2025)
இறுதி தவணைப் பரீட்சை - 2024 (2025) / Year End Term Test - 2024 (2025)

ශ්‍රේණිය / தரம் / Grade } 11 ශ්‍රේණිය

**ඉතිහාසය I**

කාලය / நேரம் / Time } පැය 1 යි

නම / பெயர் / Name } ..............................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ..............................

**සැලකිය යුතුයි:**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 80 ක් හිමිවේ.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ඇති පිළිතුරු පත්‍රයේ අදාල කවය තුළ (×) සලකුණ යොදන්න.

---

(01) අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගය ආරම්භය දක්වා ලිය වී ඇති කෘතිවල ප්‍රධාන අරමුණ වූයේ ,
(1) රජවරුන් පිළිබඳ වර්ණනා කිරීම (2) ආගමික තොරතුරු ඉදිරිපත් කිරීම
(3) රටේ ආර්ථික තොරතුරු ඉදිරිපත් කිරීම (4) දේශපාලන තොරතුරු ඉදිරිපත් කිරීම

(02) ගම්පොළ රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය සමය දක්වා මෙරට දේශපාලන තොරතුරු හැදෑරීමට වඩාත් වැදගත්වන කෘතිය වනුයේ ,
(1) සද්ධර්මරත්නාවලිය (2) බෝධි වංසය (3) රාජාවලිය (4) දීපවංසය

(03) පූර්ව ඓතිහාසික යුගයේ ශිලා මංජුසා සොහොන් හමු වූ ස්ථාන ඇතුලත් පිළිතුර තෝරන්න.
(1) ඉබ්බන්කටුව,යටිගල්පොත්ත,ගල්සොහොන් කනත්ත
(2) හල්දුම්මුල්ල,ඉබ්බන්කටුව,රංචාමඩම
(3) ඉබ්බන්කටුව,රංචාමඩම,නිකවලමුල්ල
(4) බෙරගල,නිකවලමුල්ල,රංචාමඩම

(04) රතු පැහැති ගුරුගල් ආලේප කරන ලද දෙකට බෙදෙන සේ සිදුරුවිද ඇති මිනිස් හිස් කබලක් හමුවූයේ කුමන ස්ථානයේද ?
(1) පොතාන ගල් ගුහාව (2) රාවණා ඇල්ල ගල් ගුහාව
(3) පාහියංගල ගල් ගුහාව (4) කුරුවිට බටදොඹ ලෙන

(05) වංශකතාවල හා සෙල්ලිපි වල සඳහන් පරිදි "නියම්ගම්" යනුවෙන් හඳුන්වා ඇත්තේ ?
(1) වෙළඳගම් (2) ගොවියන් විසූ ගම් (3) වරාය ආශ්‍රිත ගම් (4) ජනතාව අතහැර දැමූ ගම්

(06) ඓතිහාසික මූලාශ්‍ර වලට අනුව මෙරට පාලනය කල ප්‍රථම රජු වූයේ ,
(1) පණ්ඩුකාභය රජු (2) දුටුගැමුණු රජු (3) වසභ රජු (4) විජය රජු

(07) රාජ්‍ය උරුමය පියාගෙන් පුතාට හිමිවීම පිළිබඳව දියහැකි උදාහරණය නම් ,
(1) දුටුගැමුණු රජුගෙන් සද්ධාතිස්ස රජුට (2) දේවානම්පියතිස්ස රජුගෙන් උත්තිය රජුට
(3) වසභ රජුගෙන් වංකනාසික තිස්ස රජුට (4) කාශ්‍යප රජුගෙන් මුගලන් රජුට

(08) විවිධ රාජ්‍යත්ව සංකල්ප තුලින් රජුගේ උසස්බව පෙන්වා දී ජනතාව රජුගෙන් බලාපොරොත්තු වූයේ .
(1) රණකාමීත්වය (2) රාජ්‍යවිශාල කර ගැනීම
(3) ආදර්ශවත් බව (4) සටන් ව්‍යාපාර

(09) සෙල්ලිපි වල කැති අඩ හා කෙටු කනබ අය වශයෙන් හඳුන්වා දී තිබෙන්නේ ,
(1) ඡේන්වලින් අයකල බදුය (2) කුඹුරුවලින් අයකල බදුය
(3) වරාය ආශ්‍රිතව අයකල බදුය (4) වැව් වලින් අයකල බදුය



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(10) "තතවය" නම් වචනය යෙදී ඇති සෙල්ලිපිය පිහිටා ඇත්තේ ?

(1) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මුතුගල්ල නම් ස්ථානයේ
(2) හම්බන්තොට දිස්ත්‍රික්කයේ මණ්ඩගල නම් ස්ථානයේ
(3) මහනුවර දිස්ත්‍රික්කයේ වේගිරිය දේවාලය අසල
(4) හම්බන්තොට දිස්ත්‍රික්කයේ වෙහෙරකෙම නම් ස්ථානයේ

(11) නායක ස්වාමීන් වහන්සේ යටතේ වැඩ වාසය කළ භික්ෂූන් වහන්සේලා හඳුන්වන ලද්දේ ,

(1) භානකවරුන් නමිනි (2) අන්තේවාසික නමිනි (3) සද්ධිවිහරිය නමිනි (4) ථෙර නමිනි

(12) සැතපුම් හතක් පමණ දිග , උස අඩි හතළිස් හතරක් වන වැව් බැම්මක් දක්නට ලැබෙන්නේ,

(1) තිසා වැවේය (2) යෝධ වැවේය (3) හුරුළු වැවේය (4) කලා වැවේය

(13) අතීත ශිල්පීන් වජ්‍ර චුම්බට භාවිතා කර ඇත්තේ ,

(1) ගොඩනැගිලිවල ගිලා බැසීම වලක්වා ලීමට
(2) ගොඩනැගිලිවල කල් පැවැත්මට
(3) දාගැබ් අලංකරණයට
(4) අකුණු සැර වලින් ආරක්ෂා වීමට

(14) ස්වාභාවික සුළං බලය උපයෝගි කරගෙන අපේ මුතුන් මිත්තන් යකඩ නිස්සාරණය කළ බවට සාක්ෂි හමු වූ ප්‍රදේශය වන්නේ ,

(1) දෙහිගහ ඇළ කන්ද (2) සමනළ වැව (3) බෙරගල (4) හල්දුම්මුල්ල

(15) සෙල්ලිපි වල කුඩීන් නමින් හඳුන්වා දී ඇත්තේ ,

(1) සාමාන්‍ය ජනතාවය
(2) ධනවත් වෙළඳ ප්‍රධානීන්ය
(3) ගුරුවරුන්ය
(4) වෛද්‍යවරුන්ය

(16) පැරණි සමාජය තුළ කාන්තාවන්ට ගෞරවනීය ස්ථානයක් හිමිවිය ."**මධුපාචිකා**"යනුවෙන් හැඳින්වූයේ ?

(1) මිහිරි වචන කථාකල කාන්තාවන්ය
(2) ස්වාමියාගේ සිත දිනාගත් කාන්තාවන්ය
(3) සූප ශාස්ත්‍රයෙහි දක්ෂ කාන්තාවන්ය
(4) රට පාලනය කල කාන්තාවන්ය

(17) ශ්‍රී ලංකාවේ පළමු නාගරීකරණයට අයත් නගර දෙක වන්නේ ?

(1) අනුරාධපුරය හා දඹදෙනිය
(2) අනුරාධපුරය හා මාගම
(3) පොළොන්නරුව හා යාපහුව
(4) පොළොන්නරුව හා කුරුණෑගල

(18) දෙවන විමලධර්මසූරිය රජු මෙරටට උපසම්පදාව ගෙන ඒමට කටයුතු කළ රට වන්නේ ,

(1) මලයාසියාව (2) චීනය (3) බුරුමය (4) තායිලන්තය

(19) උඩරට ප්‍රදේශය ස්වාධීන රාජ්‍යයක් ලෙස ගොඩනැගූ රජු වන්නේ ,

(1) කරලියද්දේ බණ්ඩාර රජුය
(2) සේනාසම්මත වික්‍රමබාහු රජුය
(3) පළමුවන විමලධර්මසූරිය රජුය
(4) ජයවීර බණ්ඩාර රජුය

(20) රදළ ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් ප්‍රදානය කළ ඉඩම් වර්ගය නම් ,

(1) ගබඩාගම් (2) නින්දගම් (3) පරවේනිගම් (4) විහාරගම්

(21) ක්‍රි.ව 1453 දී ඔටෝමන් තුර්කිවරු යටතට පත් වූ වෙළඳ නගරය වනුයේ ?

(1) පැරිසිය (2) වැනිසිය (3) කොන්ස්තන්තිනෝපලය (4) ජීනෝවා

(22) දේශ ගවේෂණයට මුලින්ම උනන්දු වූ රටවල් දෙක වන්නේ ?

(1) බ්‍රිතාන්‍ය හා පෘතුගාලය
(2) පෘතුගාලය හා ස්පාඤ්ඤය
(3) බ්‍රිතාන්‍ය හා ප්‍රංශය
(4) ස්පාඤ්ඤය හා ප්‍රංශය


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(23) යුරෝපයේ 16 වන සියවස වන විට දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වැදගත්ම වෙනස්කම නම් ,

(1) ආගමික පුනරුදය (2) දේශගවේෂණය
(3) බලතල විමධ්‍යගත වීම (4) ජාතික රාජ්‍ය බිහිවීම

(24) පෘතුග්‍රීසීන් මෙරටට පැමිණෙන විට කෝට්ටේ රාජධානියේ පාලකයා වූයේ ?

(1) හයවන පරාක්‍රමබාහු රජු (2) අටවන වීර පරාක්‍රමබාහු රජු
(3) හයවන විජයබාහු රජු (4) හත්වන බුවනෙකබාහු රජු

(25) ලන්දේසීන්ගේ පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය වූයේ ?

(1) ගෝව (2) මදුරාසිය (3) බතාවිය (4) පොන්ඩිචෙරි

(26) යුරෝපයේ කාර්මීකරණය වීමත් සමග ඇති වූ ප්‍රධානතම සමාජීය ප්‍රතිඵලය කුමක්ද ?

(1) සැපවත් විනෝදකාමී සමාජයක් බිහිවීම (2) සමාජයේ සියලුම දෙනා ධනවතුන් වීම
(3) පන්ති සහිත සමාජයක් බිහිවීම (4) සමාජ අපචාර අඩු වීම

(27) ක්‍රි.ව 1797 දී ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල ඇතිවූ කැරැල්ලට ප්‍රධාන හේතුව වූ බදු වර්ගය නම් ?

(1) තුවක්කු බද්ද (2) වෙළඳසැල් බද්ද (3) පොල්ගස් බද්ද (4) සුනඛ බද්ද

(28) ක්‍රි.ව 1848 නිදහස් සටනට ආසන්නතම හේතුව මින් කුමක්ද ?

(1) රජයේ සිවිල් සේවා තනතුරු සංඛ්‍යාව අඩු කිරීම (2) ටොරින්ටන් ස්වාමීවරයා අලුත් බදු වර්ග රැසක් පැනවීම
(3) කැමරන්ගේ අධිකරණ ක්‍රමය (4) ගම්සභාව අහෝසි කිරීම

(29) සිංහල බෞද්ධයා හා මහාබෝධි සඟරාව වැනි ප්‍රකාශන වලට ලිපි සපයමින් බෞද්ධ සහජීවනයේ වටිනාකම පැහැදිලි කරන ලද නායකයා වූයේ,

(1) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා (2) පියදාස සිරිසේන මහතා
(3) වලිසිංහ හරිශ්චන්ද්‍ර මහතා (4) අනගාරික ධර්මපාල තුමා

(30) කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවීමට පුරෝගාමී වූ ඉස්ලාම් ආගමික නායකයා මින් කවුරුන්ද?

(1) සිද්දි ලෙබ්බේ මහතා (2) ටී.බී.ජයා
(3) ආරුමුග නාවලර් තුමා (4) පොන්නම්බලම් අරුණාචලම් මහතා

(31) රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම ,විධායක කාරක සභා ක්‍රමය යන මේවා හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මින් කුමක්ද ?

(1) කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය (2) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
(3) මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය (4) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

(32) ඉංග්‍රීසීන් මෙරට වතු වගාව ව්‍යාප්ත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙරට ජනතාවට මුහුණ දීමට සිදුවූ ගැටලුවක් වන්නේ ,

(1) ගම්සභා වැනි ප්‍රයෝජනවත් ආයතන විනාශ වීම (2) මධ්‍යසාර භාවිතය රටපුරා ව්‍යාප්ත වීම
(3) ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම (4) සුළු පරිමාණ කර්මාන්ත ඇතිවීම

(33) ක්‍රි.ව 1833 කෝල්බෲක් කොමිසමේ ආර්ථික ප්‍රතිසංස්කරණ පමණක් ඇතුලත් පිළිතුර මින් කුමක්ද ?

A. දිවයින පළාත් 5 කට බෙදීම
B. සිවිල් නිළධාරින්ට වතු වගාවේ යෙදීමට අවසර දීම
C. අනිවාර්ය සේවා රාජකාරී ශ්‍රම ක්‍රමය අහෝසි කිරීම
D. ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම

(1) A හා C (2) C හා D (3) B හා D (4) B හා C


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(34) 1947 සිට 1972 දක්වා ලංකාවේ ක්‍රියාත්මක වූ සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ එංගලන්ත කිරීටය නියෝජනය කල තනතුර තෝරන්න ?

(1) අග්‍රාණ්ඩුකාරවරයා (2) ආණ්ඩුකාරවරයා (3) ජනාධිපතිවරයා (4) කථානායකවරයා

(35) ශ්‍රී ලංකාවේ වඩාත් පැරණිම දේශපාලන පක්ෂය කුමක්ද ?

(1) එක්සත් ජාතික පක්ෂය
(2) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
(3) ලංකා සම සමාජ පක්ෂය
(4) ලංකා කොමියුනිස්ට් පක්ෂය

(36) 1978 ආණුඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිහිට වූ පාර්ලිමේන්තුව සතු බලතල නිවැරදිව දැක්වෙන පිළිතුර මින් කුමක්ද ?

A. මුදල් පරිපාලනය
B. ඡන්ද පෙත්සම් පිළිබඳ පරීක්ෂා කිරීම
C. අයවැය සකස් කිරීම
D. අගමැතිවරයා පත් කිරීම

(1) A හා B (2) A හා C (3) B හා D (4) C හා D

(37) ඉංග්‍රීසින් විසින් උතුරු ඇමරිකාවේ පිහිට වූ ප්‍රථම බ්‍රිතාන්‍ය ජනපදය වන්නේ ?

(1) ජෝර්ජියා (2) වර්ජිනියා (3) නිව්ජර්සි (4) නිව්ජර්සි

- **38,39.40 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී පහත A,B,C,D යුගලයන් භාවිතා කරන්න.**

A. 1. දෙවන ලෝක යුද්ධය
   2. සරයේවෝ සිද්ධිය

B. 1. වර්සෙල්ස් ගිවිසුම
   2. පළමු ලෝක යුද්ධය

C. 1. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
   2. අභියාචනාධිකරණය

D. 1. කාර්මික විප්ලවය
   2. පරිසර දූෂණය

(38) පළමු වැන්න නිසා දෙවැන්න හඳුන්වාදීම පෙන්වන යුගලය වන්නේ,

(1) A (2) B (3) C (4) D

(39) පලමු වැන්න දෙවැන්නේ ප්‍රතිඵලයක් වූ යුගලය වන්නේ,

(1) A (2) B (3) C (4) D

(40) පලමු වැන්න හා දෙවැන්න අතර කිසිදු සම්බන්ධතාවයක් නොපෙන්වන යුගල වන්නේ,

(1) A (2) B (3) C (4) D


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

අවසාන වාර පරීක්ෂණය - 2024 (2025)
**இறுதி தவணைப் பரீட்சை - 2024 (2025) / Year End Term Test - 2024 (2025)**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } 11 ශ්‍රේණිය | **ඉතිහාසය II** | කාලය / நேரம் / Time } පැය 3 යි මි. 10 යි |

නම / பெயர் / Name } ..................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ....................................

**සැලකිය යුතුයි:**

- **අමතර කියවීම් කාලය විනාඩි 10 කි.**
- I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකටද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.පිළිතුරු සඳහා ලකුණු 120 ක් හිමිවේ.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහිද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝකසිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) දඹකොල පටුන,හුරුළු වැව,මල්වතු ඔය,මැණික්ගඟ,ගල්ඔය ජලාශය,කෝට්ටේ,දේවනගර්,පොළොන්නරුව, හෝර්ටන්තැන්න,මිණිපේ අමුණ,හලාවත,ඉබ්බන්කටුව (ලකුණු 12)

(ii) ජපන් දූපත්,කැලිකට්,පෘතුගාලය,කොන්ස්තන්තිනෝපලය,රතු මුහුද,ඇෆ්ගනිස්ථානය (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට අදාල පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. කාර්මික විප්ලවය ආරම්භ වූ රට
B. කලා වැවේ සිට තිසා වැව දක්වා ඉදි කළ ඇළ මාර්ගය
C. ගම්පොළ යුගයේ මෙරටට පැමිණි ආක්‍රමණිකයා
D. ඒ.ඊ. ගුණසිංහ කම්කරු නායකයා යටතේ පිහිට වූ පක්ෂය (ලකුණු 04 )

- **A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.**

(ii)
1. A රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
2. මෙය හමු වන්නේ කුමන ප්‍රදේශයෙන්ද?
3. මෙය ඉදි කර ඇත්තේ කුමන ගංගාවක් හරහාද?
4. මෙය නිර්මාණය සඳහා යොදාගෙන ඇති ද්‍රව්‍යයක් නම් කරන්න? (ලකුණු 04)

A



(iii)
1. B රූපයෙන් දැක්වෙන්නේ කවුරුන්ද?
2. ඔහු නියෝජනය කල දේශපාලන පක්ෂය කුමක්ද ?
3. මොහු සම්බන්ධ වන්නේ කුමන විප්ලවය සමඟද?
4. මොහු පිළිගත් දේශපාලන දර්ශනය කුමක්ද ? (ලකුණු 04)

B





iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

## II කොටස

(02) I. මහාවංශය ලිවීමට ආභාසය ලබාගත් ග්‍රන්ථ තුනක් නම් කරන්න. (ලකුණු 03)

II. ඉතිහාසය ගොඩනැගීමට සාහිත්‍ය මූලාශ්‍ර යොදා ගැනීමේදී සැලකිල්ලට ගත යුතු කරුනු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. ඉතිහාසය හැදෑරීමේදී කාසි වැදගත් මූලාශ්‍රයක් වන ආකාරය කරුනු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

IV. ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම කරුනු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) I. ගල් යුගයට අයත් ප්‍රජාව ජීවත් වූ පරිසර කලාප තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

II. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. පූර්ව ඓතිහාසික යුගයේ දියුණු තාක්ෂණයක් පැවති බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

IV. පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ ජීවන රටාව සකස්ව තිබූ ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. ( ලකුණු 06)

(04) I. ගම් නායකයකු විසින් ඉටු කල යුතු කාර්යයන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

II. රාජ්‍යත්ව සංකල්ප හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. ලංකා ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පාලකයකු වශයෙන් වසභ රජතුමා සැලකීමට හේතුවන කරුණු 02 ක් සඳහන් කරන්න. (ලකුණු 05)

IV. පැරණි පාලකයින් මෙන්ම ජනතාවද මෙරට තුළ වාර්ගික සහජීවනයෙන් කටයුතු කල බව උදාහරණ තුනක් සපයා පැහැදිලි කරන්න. (ලකුණු 06)

(05) I. ඇළහැර ඇළ මගින් ජලය ගෙනයනු ලබන වැව් තුනක් නම් කරන්න. (ලකුණු 03)

II. බදුලු ටැම් ලිපියේ දක්නට ලැබෙන වෙළඳ නීති දෙකක් ලියන්න. (ලකුණු 04)

III. පුරාණ යකඩ නිස්සාරණය සඳහා තාක්ෂණය භාවිතාකර ඇති ආකාරය පිළිබඳව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

IV. අතීත ශ්‍රී ලංකාවේ පැරණි සමාජය තුළ කාන්තාවට ගෞරවනීය තත්ත්වයක් හිමි වූ බව උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) I. පොළොන්නරුව රාජධානිය බිඳවැටීමෙන් පසු පහත සඳහන් ස්ථානවල පාලන මධ්‍යස්ථාන පිහිටුවාගත් පුද්ගලයින් අනුපිළිවෙලින් නම් කරන්න.

A. ගංදෙනිය

B. ගෝවින්ද මලය

C. යාපහුව (ලකුණු 03)

II. පැරණි නගර පරිහානියට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. දෙවන රාජසිංහ රජු උඩරට රජ වීමෙන් පසු මුහුණ දුන් අභියෝග දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

IV. මහනුවර රාජධානියේ පරිපාලනය සංවිධානය වී තිබූ ආකාරය කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(07) I. බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් වානිජ බෝග තුනක් නම් කරන්න . (ලකුණු 03)

II. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. බ්‍රිතාන්‍ය පාලනය නිසා ශ්‍රී ලංකාවට ඇති වූ යහපත් ප්‍රතිඵල දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

IV. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයා සතු බලතල තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) I. පුනරුද සමයේ එංගලන්තයෙන් බිහි වූ ගත් කතුවරු තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

II. පහත A,B,C,D ප්‍රකාශනවලට අදාල පුද්ගලයින් කවුරුන්දැයි වරහන් තුලින් තෝරා අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න

A. පෘතුවිය ගෝලාකාර බව සහ සියළු ග්‍රහයන් සූර්යයා වටා ඉලිප්සාකාරව ගමන් කරන බව සොයා ගැනීම

B. ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම

C. මොනාලිසා චිත්‍රය නිර්මාණය කිරීම

D. මුද්‍රණ යන්ත්‍රය නිපදවීම (ලකුණු 04)

(ජොහැන්නස් ගුටන්බර්ග්, නිකලස් කොපර්නිකස්, ලියනාඩෝ ඩාවින්චි, ජොහැන්නස් කෙප්ලර්, රෆායල් සැන්සියෝ, අයිසෙක් නිව්ටන්)

III. යුරෝපයේ පුනරුදය ඇතිවීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

IV. පුනරුදය ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රය තුළ සිදුකළ වෙනස්වීම් තුනක් විස්තර කරන්න (ලකුණු 06)

(09) I. පළමු ලෝක යුද්ධය අවසානයේ ප්‍රංශයේ පැරිස් නුවර පවත්වන ලද සාකච්ඡාවට සහභාගී වූ පහත සඳහන් නායකයන් අනුපිළිවෙලින් නම් කරන්න

A. ඉතාලිය B.බ්‍රිතාන්‍ය C.ප්‍රංශය (ලකුණු 03)

II. A. ජාතීන්ගේ සංගමයේ මූලිකත්වය ගත් ඇමරිකානු ජනාධිපති නම් කරන්න.
B .ජාතීන්ගේ සංගමය පිහිටුවීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. දෙවන ලෝක යුද්ධය ඇතිවීමට බලපෑහේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

IV. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලයේ ප්‍රධාන කාර්යන් හා බලතල කරුණු තුනක් දක්වා පැහැදිලි කරන්න. (ලකුණු 06)


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

## 11 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය 2024 (2025)

**ඉතිහාසය පිළිතුරු පත්‍රය**

**1 පත්‍රය**

| | | | | |
|---|---|---|---|---|
| (1) - 2 | (2) – 3 | (3) – 1 | (4) – 2 | (5) – 1 |
| (6) – 1 | (7) – 3 | (8) – 3 | (9) – 1 | (10) – 4 |
| (11) – 2 | (12) – 2 | (13) – 4 | (14) – 2 | (15) – 1 |
| (16) – 3 | (17) – 2 | (18) – 3 | (19) – 2 | (20) – 2 |
| (21) – 3 | (22) – 2 | (23) – 4 | (24) – 2 | (25) – 3 |
| (26) – 3 | (27) – 3 | (28) – 2 | (29) – 4 | (30) – 1 |
| (31) – 2 | (32) – 3 | (33) - 4 | (34) - 1 | (35) – 3 |
| (36) – 2 | (37) – 2 | (38) – 3 | (39) – 2 | (40) - 1 |

**11 පත්‍රය**

01. (ආ). A. බ්‍රිතාන්‍යය

B. යෝධ ඇළ/ ජය ගඟ

C. වෙන් හෝ

D. කම්කරු පක්ෂය

ii. A රූපය

1.ගල් පාලම

2. අනුරාධපුර

3. මල්වතු ඔය

4. ගල්

iii. B රූපය

1. වී.අයි. ලෙනින් මහතා

2. බොල්ෂෙවික් පක්ෂය / කොමියුනිස්ට් පක්ෂය

3. රුසියන් විප්ලවය

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

4. කොමියුනිස්ට් වාදය/ සමාජවාදය

02. I. * උත්තර විහාරට්ඨ කතා

*විනයට්ඨ කතා

*සීහලට්ඨ කතා

*කුරින්දි අට්ඨ කතා

II. *මූලාශ්‍රය රචනා වූ කාලය

*මූලාශ්‍රයේ කතුවරයා

*කතුවරයාගේ අරමුණ

*මූලාශ්‍රයට කරුණු සපයා ගත් ආකාරය

III. *රටේ ආර්ථික තත්ත්වය

*විදේශ සබඳතා

*ලෝහ භාවිතය

*වෙළඳාම

*තාක්ෂණය

IV. *තමා ජීවත් වන සමාජය හා ලෝකය පිළිබඳව අවබෝධ කර ගැනීමට

*විවිධ මත ඉවසීමට

*අතීත අත්දැකීම් තුළින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩ නැගීම සඳහා

*අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට පුරුදු වීම

*රටේ ජාතික අනන්‍යතාවය හඳුනා ගැනීමට

*ජාතික සමගිය ගොඩ නගා ගැනීමට හා මනුෂ්‍යත්වයට ආදරය කිරීමට

03. I. *ශුෂ්ක කලාපය

*අර්ධ ශුෂ්ක කලාපය

*තෙත් කලාපය

*පහත රට වියළි කලාපය

*පහත රට අතර මැදි වියළි කලාපය

*කඳුකර වියළි අතර මැදි කලාපය

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

II. *සංචාරක ජීවිතයක් ගත කිරීම

*සතුන් දඩයම් කිරීම

*ස්වභාවික පරිසරයට අනුව හැඩ ගැසීම

*ගල් ගුහා හා එළිමහන් කඳවුරු වල ජීවත් වීම

*කුඩා කණ්ඩායම් ලෙස සංවිධානය වීම

III. *ලෝහ තාක්ෂණය

*මැටි බඳුන් නිපදවීම ( සකපෝරුව මගින්)

*නිවාස තැනීමේ තාක්ෂණය

*මැටි පබළු තාක්ෂණය

IV. *ස්ථිර වාසස්ථාන භාවිතා කිරීම

*කෘෂිකර්මාන්තයේ නිරත වීම

*ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි භාවිතය

*රූපලාවන්‍ය කටයුතු

*මැටි කර්මාන්තය

*ලෝහ භාවිතය

04. I. *ගම නියෝජනය කිරීම

*ගමේ පොදු කටයුතු වලදී නායකත්වය දීම

*ගමට අයත් වැව නඩත්තු කිරීම

*එම වැවෙන් ජලය බෙදා හැරීම

*ගමේ ආරවුල් විසඳීම

*ආවාහ විවාහ කටයුතු වලට සහය දීම

*භාණ්ඩ හුවමාරුවට සහය දීම

II. *දේවත්ව

*බෝධිසත්ව

*පර්වතරාජ

*වීරත්ව

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

*චක්‍රවර්තී

III. *ලම්භකර්ණ වංශයේ පළමු රජු වීම

*රටේ අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම

*රජයේ බදු අය කිරීම් ක්‍රමවත් කිරීම

*විශාල ප්‍රමාණයේ වැව් තැනවීම

*උමං ජලමාතිකා ක්‍රමය හඳුන්වා දීම

*ජාත්‍යන්තර ගැටළු වලට සහය දීම

*වෙහෙර විහාර ඉදි කිරීම හා ප්‍රතිසංස්කරණය

IV. *විවිධ ජාතීන් මෙරට වෙළඳ කටයුතුවල නියැලීම

*බුදු සසුනේ පැවදිව සිටි දෙමළ ජාතික භික්ෂූන් වහන්සේ නමක් ගැන සඳහන් වීම

*දෙමළ ජාතික පුරුෂයෙකු සමග විවාහ වූ සිංහල කාන්තාවක් ගැන සෙල් ලිපියක සඳහන් වීම

*සමනළ කන්ද වැඳීමට විවිධ ජාතීන් යාම

*ඉන්දියානු කුළී භේවායන් දළදා මාළිගය ආරක්ෂා කිරීම

*රාජ සභාවේ දෙමළ අධිකාරී නමින් තනතුරක් තිබීම

*පැරණි කාළයේ දමිළ ජාතික පවුල් කීපයක් පදිංචි වී සිටි වීදියක් අනුරපුරයෙන් සොයා ගැනීම

05. I. *මින්නේරිය

*ගිරිතලේ

*කවුඩුල්ල

*කන්තලේ

II. *හෝපිටිගම වෙළඳපළ සීමාවේ වෙළඳාම් කරන අයගෙන් පමණක් බදු අය කළ යුතු වන අතර වෙළඳපළ පසුකොට යන්නවුන්ගෙන් බදු අය නොකළ යුතු බව

*නිලධාරීන්ට නොපෙන්වා එම වෙළඳපළේ භාණ්ඩ විකුණන අයගෙන් දෙගුණයක් බදු අය කළ යුතු බව

*රජයේ නිලධාරීන් විසින් ප්‍රමිතිගත නොකරන ලද මදටිය බර (තරාදි පඩි) යොදා වෙලඳාම් නොකළ යුතු බව

*බුලත් පුවක් විකිණීම ඒ සඳහා සකස් කරන ලද මණ්ඩප වල පමණක් තබා වෙළඳාම් කළ යුතු බව

*පොහොය දිනවල වෙළඳාම් කළ අයගෙන් දඩයක් වශයෙන් තෙල් බද්දක් ලබා ගත යුතු බව

III. *ස්වභාවික සුළං බලය ලබා ගැනීම

(සමනල වැව ප්‍රදේශය)

*මයිනහමක ආධාරයෙන් සුරන් බලය ලබා ගැනීම

( දෙහි ගහ ඇලකන්ද ප්‍රදේශය)

IV. *රාජ්‍ය පාලන අවස්ථාව ලැබීම( රාජකීය/ සාමාන්‍ය)

*දැඩි සමාජ බැඳීම් වලින් පීඩාවට පත් නොවීම

*මව්වරුන් ලෙස ගෞරවය ලැබීම

*සූප ශාස්ත්‍රයෙහි දක්ෂයන් වීම

*රූපලාවන්‍ය කටයුතුවල නියැළීමට අවස්ථාව ලැබීම

06. I. A. සංඛ සෙනවියා

B. බුවනෙකබාහු ආදිපාදවරයා

C. සුභ සෙන්පතියා

II. * සතුරු ආක්‍රමණ

*මධ්‍යගත පාලනය බිඳ වැටීම

*ආරක්ෂාව නැතිවීම

*වෙළඳාම හා ගමනාගමන කටයුතු අඩපණ වීම

*ජනතාව වෙනත් ප්‍රෙද්ශ වලට සංක්‍රමණය වීම

III. *පෘතුගීසීන්ගෙන් උඩරටට එල්ල වන ප්‍රහාර මැඩ පැවැත්වීම

*පෘතුගීසීන් මෙරටින් පලවා හැරීම

* උඩරට රඳළ ප්‍රධානීන්ගෙන් එල්ල වූ තර්ජන අවම කර ගැනීම

*ලන්දේසි බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම

IV. *පාලනයේ ඉහළම පුද්ගලයා රජු වීම හා ඔහු සතු බලතල

*රජවාසල කටයුතු සඳහා වෙන වෙනම නිලධාරීන් සිටීම

*රටවසම හෙවත් ප්‍රාදේශීය පාලනය

*බද්දේ සංවිධාන

*අධිකරණ කටයුතු

07. I. කෝපි, කොකෝවා, සින්කෝනා, තේ, රබර්

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

II. *රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම

*සර්වජන චන්ද බලය ලබාදීම

*විධායක කාරක සභා ඇති කිරීම

III. *ජාත්‍යන්තර භාෂාවක් වන ඉංග්‍රීසි භාෂා දැනුම රට තුළ පැතිරීම

*ගමනාගමන කටයුතු දියුණු වීම

*අපනයන වැවිලි භෝග හඳුන්වාදීම

*පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය ලැබීම

*සුළු පරිමාණ කර්මාන්ත බිහිවීම

IV. *ව්‍යවස්ථාදායක බලතල

*විධායක බලතල

*අධිකරණ බලතල

(පෙළ පොත 93 පිටුව)

08\. I. *සර් තෝමස් මුවර්

*ප්‍රැන්සිස් බේකන්

*විලියම් ෂේක්ස්පියර්

II. A. ජර්මන් ජාතික ජොහැන්ස් කෙප්ලර්

B. අයිසෙක් නිව්ටන්

C. ලියනාඩෝ ඩාවින්චි

D. ජොහැන්ස් ගුටෙන්බර්ග්

III. *කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කි ජාතිකයන්ට යටත් වීම

*වෙළඳාම දියුණු වීම හා නව ධනවතුන් පිරිසක් බිහිවීම

*බුද්ධි ප්‍රබෝදය

*පල්ලියේ ආධිපත්‍යය විවේචනය වීම්

IV. *රාජාණ්ඩු පාලන ක්‍රමය බිඳවැටී පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ලැබීම

*ප්‍රාදේශීය පාලනයේ වෙනස්කම් ඇතිවීම සහ නව නිලධාරී පන්තියක් බිහිවීම

*පැරණි නීති රීති පද්ධතිය අභාවයට ගොස් නව අධිකරණ පද්ධතියක් ස්ථාපිත වීම්

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

09 I. A. විටෝරියෝ ඕලැන්ඩෝ

B. ලොයිඩ් ජෝර්ජ්

C. ක්ලෙමන්ෂෝ

II. A. වුඩ්රෝ විල්සන්

B. *රටවල් අතර ඇතිවන වාද භේද සාමකාමීව විසඳීම

*අනාගතයේ ලෝක යුද්ධ ඇතිවීම වැළැක්වීම

*ජාත්‍යන්තර අවබෝධය හා සහයෝගය ගොඩනැගීම

*කුඩා රාජ්‍යයන්ගේ නිදහස හා ස්වාධීනත්වය ආරක්ෂා කිරීම

*විශ්ව සාමූහිකත්වය මගින් ලෝක සාමය සුරක්ෂිත කිරීම

III. *ජර්මනියේ හිට්ලර් බලවත් වීම හා ඔහුගේ ක්‍රියා කලාපය

* ඉතාලියේ මුසෝලිනීගේ ක්‍රියාකලාපය

* ජපානයේ ක්‍රියා කලාපය

* ජාතීන්ගේ සංගමයේ දුර්වලතා

IV. *අන්තර්ජාතික සාමයට හා ආරක්‍ෂාවට අදාළ ඕනෑම ප්‍රශ්නයක් සාකච්ඡා කිරීම හා ඒ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම

*සාමාජික රාජ්‍යයන්ගේ ආර්ථික සෞඛ්‍ය මානව අයිතිවාසිකම් ආදී ක්ෂේත්‍රවල ප්‍රවර්ධනය උදෙසා යෝජනා ඉදිරිපත් කිරීම

*එක්සත් ජාතීන්ගේ අයවැය සලකා බලා අනුමත කිරීම හා සාමාජික රටවල් විසින් ගෙවිය යුතු දායක මුදල් ප්‍රමාණය සලකා බැලීම

*ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ මත මහලේකම්පත් කිරීම අන්තර්ජාතික අධිකරණයට විනිශ්චකරුවන් පත් කිරීම සහ නව සාමාජිකයන් සංවිධානයට බඳවා ගැනීම

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources




iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

11 ශ්‍රේණිය.




www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources